මධ්‍යම පළාත් සභාවේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව
மத்தியமாகாணசபையின் அரசசேவைகள் ஆணைக்குழு
Public Service Commission of Central Provincial Council
අංක 244, කටුගස්තොටපාර, මහනුවර
இல. 244,கடுகஸ்தொட்டைவீதி,கண்டி
No. 244, Katugasthota Road, Kandy.
web site: *www.psc.cp.gov.lk*
e-mail: *psc.cp.gov@gmail.com*

කාර්යාලය காரியாலயம் Office	081-2213097	ලේකම් செயலாளர் Secretary	081-2213096	සහකාරලේකම් உதவிசெயலாளர் Asst. Secretary	081-5631321	ෆැක්ස් பெக்ஸ் Fax	081-2213082

මගේඅංකය
எனது இல.
My No. CPC/PSC/40/21/2025

ඔබේඅංකය
உமது இல
Your No.

දිනය
திகதி
Date 2026.01. 12

රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ ලිපි අංක -: 01/2026

මධ්‍යම පළාතේ,
ප්‍රධාන ලේකම්,
ආණ්ඩුකාර ලේකම්,
සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්, සභා ලේකම්,
සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන් හා
සියලුම ආයතන ප්‍රධානීන් වෙත,

<u>මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා පත්වීම් බලධාරිත්වය දරණ තනතුරු වලට අදාලව බඳවාගත් බහුකාර්ය සංවර්ධන කාර්ය සහයකයින්ගේ රාජ්‍ය භාෂාව තීරණය කිරීම</u>

බහුකාර්ය සංවර්ධන කාර්ය සාධක බලකා දෙපාර්තමේන්තුව යටතේ බඳවා ගනු ලැබ ඇති පුහුණු බහුකාර්ය සංවර්ධන කාර්ය සහයකයින් වෙත මධ්‍යම පළාත් රාජ්‍ය සේවය යටතේ ප්‍රාථමික ශිල්පීය නොවන සේවයේ (PL) තනතුරු වල පැවති පුරප්පාඩු සඳහා අවස්ථා කීපයකදී ස්ථිර පත්වීම් ප්‍රදානය කර ඇත.

02. මෙම බහුකාර්ය සංවර්ධන කාර්ය සහයකයින් හට ස්ථිර පත්වීම් ලබා දීමට පෙර ඔවුන් සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් වෙත පමණක් ඉදිරිපත් කර අදාළ සුදුසුකම් පරීක්ෂා කර ඇත.

03. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ **18/2020** අනුව, රාජ්‍ය සේවය සඳහා බැඳෙන සෑම රාජ්‍ය සේවකයෙකුම තමන් විසින් රාජ්‍ය සේවයට බැඳුනු රාජ්‍ය භාෂාවට අතිරේක වශයෙන් අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳවද ප්‍රවීණතාවයක් ලබා ගත යුතුය. එබැවින්, මෙම බහුකාර්ය සංවර්ධන කාර්ය සහයකයින්ව සිට ස්ථිර පත්වීම් ලැබූ සේවක මහත්ම/මහත්මීන් විසින් රාජ්‍ය සේවයට බැඳුණු රාජ්‍ය භාෂාව ලෙස 'ශිෂ්‍ය කාර්ය දර්ශකයේ තමන් විසින් ඉගෙනගත් මාධ්‍ය' සේ සඳහන් වන භාෂාව සලකා කටයුතු කරන ලෙස කාරුණික දන්වා සිටිමි.

04. ඒ අනුව, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ **18/2020** හි විධිවිධාන අනුව අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගැනීමට තම කාර්යාලයේ සේවය කරන සේවක මහත්ම/මහත්මීන් දැනුවත් කරන ලෙස වැඩි දුරටත් දන්වා සිටිමි.

ගරු කොමිෂන් සභාවේ නියමය පරිදි,

කේ.කේ.ජී.අයි.ඩී.පී.විජේතිලක,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
මධ්‍යම පළාත.